# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්තමේන්තුව

## අගෝස්තු 04 වන සතිය - බුද්ධ ධර්මය - 1 ශ්‍රේණිය

සැකසුම - ජේ.ඒ.ඩී. කෞශල්‍යා - ර/බළ/රංවල මහ විද්‍යාලය

**පුංචි දූවේ පුතේ, අම්මට හරි තාත්තට හරි එක්ක එකතු වෙලා මෙම පාඩම් ටික කියවන්න.මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර කියනන්න.**

පාඩම 27 : නමදිමු ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ
පාඩම 28 : රුවන්වැලි සෑය වඳිමු

1. ශ්‍රී මහ බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරවූයේ කවුද?
2. දුමින්දාගමනය ලෙස හඳුන්වන්නේ කුමක් ද?
3. ශ්‍රී මහ බෝධීන් වහන්සේ රෝපණය කරවූයේ කොහේ ද?
4. සංඝමිත්තා තෙරණින් වහන්සේ වැඩම කළේ කොහේ සිට ද?
5. රුවන්මැලි සෑය සෑදූ රජතුමා කවුද?
6. රුවන්මැලි සෑය තිබෙන්නේ කොහේ ද?
7. ලංකාවේ ඇති පූජනීය ස්ථාන දෙකක් නම් කරන්න
8. පහත කවිය පාඩම් කරන්න.මෙම කවියෙන් වන්දනා කරන්නේ කුමන ස්ථානයක් ද?

| | |
|---|---|
| කිරි පාටින් | බැබළෙන්නේ |
| සම්බුදු ගුණ | පැතිරෙන්නේ |
| රන්මැලි සෑ | සමිඳුන්නේ |
| සාදු සාදු | නමදින්නේ |

9. පහත කවිය පාඩම් කරන්න.මෙම කවියෙන් වන්දනා කරන්නේ කුමන ස්ථානයක් ද?

| | |
|---|---|
| සිලි සිලි පහස | පැතිරෙන්නේ |
| මෙත් සිසිලසකි | මතුවන්නේ |
| සිරිමා බෝ | සමිඳුන්නේ |
| සාදු සාදු | නමදින්නේ |

10. ශ්‍රී ලංකාවේ ඇති තවත් වැදගත් සිද්ධස්ථාන දෙකක් නම් කියන්න.( ශ්‍රී මහ බෝධීය හා රුවන්මැලි සෑය හැර)

සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !